**DP/OL/2020/2**

මගේ අංකය ඃ 6/4/OL/2020
පාසල් විභාග සංවිධාන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2020 ජුලි මස  දින

සියලු ම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා විදුහල්පතිවරුන් වෙත,

## <u>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020</u>

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය - 2020 සඳහා පෙනී සිටීමට නියමිත පාසල් අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ උපදෙස් මේ සමග එවමි. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 2020 අගෝස්තු මස 31 දින වේ.

01. මාර්ගගත ආකාරයෙන් (online) පමණක් ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කර මුද්‍රිත පිටපත (Printout) ලබා ගෙන එහි අයදුම්කරුවන්ගෙන් අත්සන් යොදා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට ලැබීමට සැලැස්විය යුතුය.

02. ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේදී විෂය තෝරා ගැනීම ඉතාමත්ම නිවැරදිව සිදු කළ යුතු ය. ඉල්ලුම් පත්‍රයේ මෘදු පිටපතේ සඳහන් කර ඇති විෂයය අංක කිසිදු හේතුවක් නිසාවත් පසු ව වෙනස් කරනු නොලබන බැවින් මුල් අවස්ථාවේදී ම නිවැරදිව සම්පූර්ණ කිරීම විදුහල්පතිගේ හා ගුරුවරුන්ගේ වගකීමක් බව කරුණාවෙන් සලකන්න. විෂය ලේඛනය විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියට (www.doenets.lk) පිවිසීමෙන් බාගත (download) කර ගත හැක.

**කිසිදු හේතුවක් නිසා විභාග මධ්‍යස්ථානය, ඉල්ලුම් කරන ලද විෂයයන් හෝ ඉල්ලුම් කරන ලද මාධ්‍යය හෝ පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් ඉල්ලුම්පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කර එවීමට කටයුතු කරන්න. වැරදි විෂය ඇතුළත් කිරීම නිසා අයදුම්කරුවන්ට සිදුවන සියලු ම අපහසුතා පිළිබඳ වගකීම විදුහල්පති වෙත පැවරේ. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට මෘදු පිටපතේ සඳහන් තොරතුරු නිවැරදි තොරතුරු බවට සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.**

03. පසුගිය වර ඔබ පාසලේ අයදුම්කරුවන් පෙනී සිටි විභාග මධ්‍යස්ථානයට වඩා පහසු මධ්‍යස්ථානයක් අදාළ නගරයේ ඇත්නම් එය වෙනස් කර දෙන ලෙස අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර එහි පිටපතක් ඉල්ලුම් පත්‍ර සමග එවන්න.

04. අයදුම්කරුවන්ගේ නම් ඔවුන්ගේ උප්පැන්න සහතිකවල දැක්වෙන අයුරින් ම වාසගම සහිතව ඇතුළත් කළ යුතු ය. එසේ වාසගම ඇතුළත් නොකරන නමක් වේ නම් දෙමාපියන්ගෙන් ඒ සඳහා ලිපියක් ලබාගෙන ගොනු කර තබාගත යුතු ය. අයදුම්කරුවන්ගේ නම්වල අක්ෂර වින්‍යාසය හා ඒ නම් දැක්වෙන පිළිවෙළ හා සම්බන්ධ වැරදීම් පිළිබඳව ඉතා සැලකිලිමත් විය යුතු ය. පසුව නාම සංශෝධන සිදු කරනු නොලැබේ.

05. මෙම විභාගය සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ දත්ත ඇතුළත් කරනු ලබන අවස්ථාවේ ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් සඳහා ඔබ විසින් අනන්‍යතා අංකයක් (unique code) ලබා දිය යුතුය. ඉලක්කම් නවයකින් සමන්විත විය යුතු එය පහත දැක්වෙන ආකාරයෙන් සකස් කර ගත යුතු ය.

විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති පාසල් අංකය ඉලක්කම් 5කින් හා අයදුම්පතේ අනු අංකය ඉලක්කම් 4 සමන්විත වන ලෙස (පහත උදාහරණයන්ගේ සඳහන් පරිදි) අනන්‍යතා අංකය නිර්මාණය කර ගත යුතුය.

උදා ඃ 1. පාසල් අංකය 6259, අයදුම්පතේ අනු අංකය 1 ද නම්,
අනන්‍යතා අංකය ඃ **062590001** විය යුතු ය.

2. පාසල් අංකය 28500, අයදුම්පතේ අනු අංකය 360 ද නම්,
අනන්‍යතා අංකය ඃ **285000360** විය යුතු ය.

U. U.A.6/4 Prin Upades 2020

06. අධ්‍යාපන අමාත්‍යාංශ අංක 2006/09, 2007/06 හා 2007 මාර්තු මස 07 වැනි දින චක්‍රලේඛ අනුව අනිවාර්ය විෂයයන් 06 ද පළමු, දෙවන හා තෙවන විෂයය කාණ්ඩවලින් එක් විෂයයක් බැගින් ද වශයෙන් උපරිම විෂයන් 09 කට පෙනී සිටිය හැකි ය.

| **විෂය අංකය** | **විෂයයන්** |
|---|---|
| (11) සිට (16) තෙක් | ආගම |
| (21) | සිංහල භාෂාව හා සාහිත්‍යය |
| (22) | දෙමළ භාෂාව හා සාහිත්‍යය |
| (31) | ඉංග්‍රීසි භාෂාව |
| (32) | ගණිතය |
| (33) | ඉතිහාසය |
| (34) | විද්‍යාව |
| (60) සිට (75) තෙක් | පළමු විෂය කාණ්ඩය |
| (40) සිට (52) තෙක් | දෙවන විෂය කාණ්ඩය |
| (80) සිට (94) තෙක් | තෙවන විෂය කාණ්ඩය |

**ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටීම**

පහත සඳහන් විෂයයන් හැර අනෙකුත් විෂයයන් අයදුම්කරුවන්ගේ අභිමතය පරිදි ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ සිය මව් භාෂාවෙන් පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

- 40 - සංගීතය (පෙරදිග)
- 42 - සංගීතය (කර්ණාටක)
- 44 - නැටුම් (දේශීය)
- 45 - නැටුම් (භරත)

07. **විභාග ගාස්තු**

රජයේ පාසල්වලින්, ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල්වලින් හා පිළිගත් පිරිවෙන්වලින් මෙම විභාගයට පළමු හා දෙවැනි වතාවට පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස්ය. ඔවුන් සම්බන්ධයෙන් දත්ත ඇතුළත් කිරීමේදී **"Free"** ලෙස දත්ත ඇතුළත් කරන්න. තුන්වන වර අයදුම්කරුවන් පහත සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවිය යුතු ය.

| විෂයය ගණන | 1 | 2 | 3 | 4 | 5 | 06 - 09 තෙක් |
|---|---|---|---|---|---|---|
| ගාස්තුව | රු. 100/- | රු. 150/- | රු. 200/- | රු. 250/- | රු. 300/- | රු. 350/- |

08. පිටපත් දෙකකින් මුද්‍රණය කරගත් අයදුම්පත අයදුම්කරුවන් ලවා තොරතුරු නිවැරදි බවට තහවුරු කොටගෙන අත්සන් කරගත් එක් පිටපතක් පාසලේ රඳවාගෙන අනෙක් පිටපත මා වෙත එවිය යුතුය. එහි දී සම්පූර්ණ නම, විෂයයන්, මාධ්‍යය හා එහි ලියා ඇති අනෙක් සියලු ම තොරතුරු නිවැරදිව ඇතුළත් වී ඇත්දැයි පරීක්ෂා කර නිවැරදි බව තහවුරු කරගන්නා ලෙස අයදුම්කරුට උපදෙස් දෙන්න. **මෙම තොරතුරු නිවැරදිව ඇතුළත් කිරීම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලාගේ හා විදුහල්පතිවරුන්ගේ පූර්ණ වගකීමක් වන අතර වෙනස් කිරීම් සඳහා පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

09. විභාග දෙපාර්තමේන්තුව වෙත එවනු ලබන පිටපත විදුහල්පති විසින්ම සහතික කළ යුතුයි. (සහතික කිරීමට පෙර හොඳින් පරීක්ෂා කර බලා සියලු ම තොරතුරු නිවැරදිව ඇතුළත් කර ඇති බවට සෑහීමකට පත්විය යුතුය.)

ඔබ විද්‍යාලයෙන් දෘශ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඔවුන් වෙනුවෙන් special candidates සබැඳියේ ඇති තොරතුරු සම්පූර්ණ කළ යුතුය. මෙවැනි විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති සිසුන් වෙනුවෙන් පහත සඳහන් විශේෂ විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන බැවින් එම මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න.

- රත්මලාන අන්ධ විදුහල, රත්මලාන
- අඳ / බිහිරි විදුහල පොලොම්මාරුව, තංගල්ල
- සිව්රාජ් අන්ධ විද්‍යාලය, මහවැව
- රෝහන අඳ/බිහිරි විද්‍යාලය, වල්ගම, මාතර

10. **අනන්‍යතාව ඔප්පු කිරීම :**

මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු ම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ඉදිරිපත් වන විට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතු ය. ජාතික හැඳුනුම්පත වෙනුවට ඉදිරිපත් කළ හැක්කේ වලංගු විදේශ ගමන් බලපත්‍රය හා රියදුරු බලපත්‍රය පමණි. වෙනත් කිසිදු හැඳුනුම්පතක් වලංගු හැඳුනුම්පතක් ලෙස පිළිගනු නොලැබේ. **එබැවින් කල්වේලා ඇතිව ජාතික හැඳුනුම්පත සිසුන්ට ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීම විදුහල්පතිවරුන්ගේ වගකීමකි.**

11. මෙම විභාගය සඳහා මාර්ගගත (online) ක්‍රමය මගින් දත්ත ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මේ සමඟ ඇති උපදෙස්වලට අමතරව යම් පැහැදිලි කර ගැනීමක් වෙතොත් පහත සඳහන් ලිපිනයෙන් හෝ දුරකථන අංක මගින් විමසන්න. පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා ඔබට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ඇමුණුම 01 මගින් දක්වා ඇත.


කේ.එම්.එච්. බණ්ඩාර
විභාග කොමසාරිස්
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503, කොළඹ.

දුරකථන අංක : 011-2784208, 011-2784537, 011-3084124

ෆැක්ස් අංක : 011-2784422


බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

# අයදුම්පත් සම්පූර්ණ කිරීමට අදාළ තාක්ෂණික උපදෙස් ඇමුණුම 01

## 1. පද්ධතියට ප්‍රවේශ වීම

1.1 අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ doenets.lk නිල වෙබ් අඩවියට ප්‍රවේශ වන්න.

1.2 Online Applications අයිකනය (tile) තෝරන්න (Click කරන්න).

1.3 "G.C.E.(O/L) Examination - 2020, Application for Students Registration (School)" අයිකනය (tile) තෝරන්න.

1.4 ලැබෙන ප්‍රවේශ කවුළුවේ, ඔබට සපයා ඇති school code හා principal code ඇතුළත් කර පද්ධතියට ප්‍රවේශ වන්න.

## 2. පාසලේ මූලික තොරතුරු යාවත්කාලීන කිරීම

2.1 පාසලේ මූලික තොරතුරු සම්පූර්ණ කිරීම සඳහා වම්පස "School profile" අයිකනය තෝරා ගන්න.

2.2 මෙහිදී ඔබගේ පාසලට අදාළ තොරතුරු පෙන්නුම් කරන අතර, එහි තොරතුරු අලුතින් ඇතුල් කිරීමට හෝ මේ වන විටත් ඇති තොරතුරු වෙනස් කිරීම සඳහා Edit profile බොත්තම භාවිත කරන්න. ලැබෙන පෝරමයේ තොරතුරු සියල්ල නිවැරදිව සම්පූර්ණ කර Update Changes බොත්තම Click කරන්න.

## 3. අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීම

3.1 පළමු ක්‍රමය - සියලු ම අයදුම්කරුවන්ගේ තොරතුරු එකවර ඇතුළත් කිරීම

I. දකුණු පස ඇති "G.C.E.(O/L) Examination - 2020" අයිකනය මත Click කරන්න.

II. Candidates bulk upload මත click කරන්න.

III. Download Excel Template මත click කරන්න. (මෙම Excel වැඩපතෙහි ආකෘතියට (format) කිසිදු වෙනස්කමක් සිදු කිරීමෙන් වලකින්න.)

IV. බාගත (download) වන Excel වැඩපතේ අයදුම්කරුවන්ට අදාළ තොරතුරු, දී ඇති උපදෙස්වලට අදාළව සම්පූර්ණ කරන්න. විෂය ලේඛනය බාගත කර ගැනීම (download) සඳහා වම්පස ඇති List of Subjects අයිකනය මත click කරන්න.

V. සම්පූර්ණ කරන ලද Excel වැඩ පත .csv ගොනු ආකෘතිය (file type) භාවිත කරමින් ගබඩා (save) කර ගන්න.

VI. upload the .csv file හි ඇති choose file භාවිතා කරමින් save කරගත් .csv ගොනුව නිවැරදිව තෝරා උඩු ගත (upload) කරන්න.

VII. නිවැරදිව තොරතුරු උඩුගත වූ බවට පණිවුඩයක් දිස්වේ. එසේ නොමැති නම් ගොනු ආකෘතිය (file type .csv) හා ඇතුළත් කළ දත්තයන් නැවත පරීක්ෂා කර බලන්න.

3.2 දෙවන ක්‍රමය - එක් එක් අයදුම්කරුගේ තොරතුරු වෙන වෙනම ඇතුළත් කිරීම

I. දකුණු පස ඇති "G.C.E.(O/L) Examination - 2020" අයිකනය මත Click කරන්න.

II. Add Candidate අයිකනය මත Click කරන්න.

U. U.A.6/4 Prin Upades 2020

III. ලැබෙන කවුළුවට අයදුම්කරුගේ තොරතුරු ඇතුළත් කරන්න.

IV. Date of Birth අයිතමය සම්පූර්ණ කිරීමේ දී දිනය-මාසය-වර්ෂය ලෙස "-" සලකුණ යොදා ඇතුළත් කරන්න. (එය තෝරා ගැනීමේ පහසුකම සපයා ඇත.)

V. ඊළඟ අයදුම්කරුගේ තොරතුරු සම්පූර්ණ කිරීම සඳහා Save අයිකනය මත click කරන්න.

VI. මේ වන විට ඇතුළත් කර ඇති අයදුම්කරුවන්ගේ සියලු ම තොරතුරු පරීක්ෂා කිරීමට ඉහළ තීරුවේ ඇති Candidates අයිතමය click කරන්න.

**4. දැනටමත් තොරතුරු ඇතුළත් කළ අයදුම්කරුවකුගේ තොරතුරු වෙනස් කිරීම**

එක් එක් අයදුම්කරුගේ නම සහිත තීරුවේ ඇති දත්ත වෙනස් කිරීමේ පහසුකම ("Edit" අයිකනය) භාවිත කර වෙනස් කරන්න.

**5. අයදුම්කරුවකුගේ තොරතුරු සම්පූර්ණයෙන් ඉවත් කිරීම**

අයදුම්කරුගේ නම සහිත තීරුවේ ඇති Delete අයිකනය මත click කරන්න.

**6. විශේෂ අවශ්‍යතා සහිත අයදුම්රුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීම**

6.1 විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීම සඳහා තිරයේ ඉහළින් ඇති "Special Candidate" අයිකනය මත Click කරන්න.

6.2 එක් එක් අයදුම්කරු ඉදිරියෙන් ඇති "Edit" අයිකනය භාවිතා කර අදාළ අයදුම්කරුගේ පෞද්ගලික ලිපිනය (Private address), අබාධයේ ස්වභාවය (Disability type), ආබාධය පිළිබඳ විස්තර (details of disability) සහ විශේෂ විභාග මධ්‍යස්ථානයක් අයදුම්කරන්නේ නම් එහි නම (If special center required) සම්පූර්ණ කරන්න.

**7. අයදුම්පත්‍රය මුද්‍රණය කර ගැනීම.**

- ඔබ පාසලේ සියලු ම අයදුම්කරුවන්ගේ දත්ත නිවැරදිව ඇතුළත් කර ඇතිදැයි පරීක්ෂා කර තහවුරු කරගත් පසු Print Application අයිකනය මත click කරන්න.
- ලැබෙන pdf ගොනුව නැවතත් පරීක්ෂා කර නිවැරදි බව තහවුරු කරගෙන පිටපත් දෙකකින් මුද්‍රණය කරගන්න.

U. U.A.6/4 Prin Upades 2020

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - විෂය ලේඛනය
# க.பொ.த.(சா.தர)ப் பரீட்சை - பாடப்பட்டியல்
# G.C.E.(O/L) Examinations - List of Subjects

➢ ආගම්/சமயம்/ Religion

11 බුද්ධ ධර්මය/பௌத்தம்/ Buddhism
12 ශෛවනෙරි/சைவ நெறி / Saivanery
14 කතෝලික ධර්මය/கத்தோலிக்க திருமறை/ Catholicism
15 ක්‍රිස්තියානි ධර්මය/கிறிஸ்தவம்/ Christianity
16 ඉස්ලාම්/இஸ்லாம் / Islam

➢ භාෂාව හා සාහිත්‍යය/மொழியும் இலக்கியமும்/ Language & Literature

21 සිංහල භාෂාව හා සාහිත්‍යය/சிங்கள மொழியும் இலக்கியமும் / Sinhala Language & Literature
22 දෙමළ භාෂාව හා සාහිත්‍යය/தமிழ் மொழியும் இலக்கியமும்/ Tamil Language & Literature

31 ඉංග්‍රීසි භාෂාව/ஆங்கில மொழி/ English Language
32 ගණිතය/கணிதம்/ Mathematics
33 ඉතිහාසය/வரலாறு/History
34 විද්‍යාව/விஞ்ஞானம்/ Science

➢ පළමු විෂය කාණ්ඩය/முதலாம் பாடத்தொகுதி / Category I

60 ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය/வணிகமும் கணக்கீட்டுக் கல்வியும் / Business & Accounting Studies
61 භූගෝල විද්‍යාව/புவியியல்/ Geography
62 පුරවැසි අධ්‍යාපනය /குடியியற் கல்வி / Civic Education
63 ව්‍යවසායකත්ව අධ්‍යයනය/முயற்சியாண்மைக் கற்கை/ Entrepreneurship Studies
64 දෙවන භාෂාව (සිංහල)/இரண்டாம் மொழி (சிங்களம்)/ Second Language (Sinhala)
65 දෙවන භාෂාව (දෙමළ)/இரண்டாம் மொழி (தமிழ்)/ Second Language (Tamil)
66 පාලි/பாளி/ Pali
67 සංස්කෘත/சமஸ்கிருதம்/ Sanskrit
68 ප්‍රංශ/பிரெஞ்சு/ French
69 ජර්මන්/ஜேர்மன்/ German
70 හින්දි/ஹிந்தி/ Hindi
71 ජපන්/ஜப்பான்/ Japanese
72 අරාබි/அரபு/ Arabic
73 කොරියන්/கொரியன்/ Korean
74 චීන/சீன மொழி/ Chinese
75 රුසියන්/ரஷியன் / Russian

➢ දෙවන විෂය කාණ්ඩය/இரண்டாம் பாடத்தொகுதி / Category II

40 සංගීතය (පෙරදිග)/ சங்கீதம் (கீழைத்தேயம்) / Music (Oriental)
41 සංගීතය (අපරදිග)/சங்கீதம் (மேலைத்தேயம்)/ Music (Western)
42 සංගීතය (කර්ණාටක)/சங்கீதம் (கர்நாடகம்) /Music (Carnatic)
43 චිත්‍ර/சித்திரம் / Art
44 නැටුම් (දේශීය)/நாட்டியம் (தேசிய) / Dancing (Oriental)
45 නැටුම් (භරත)/நாட்டியம் (பரதம்) / Dancing (Bharata)
46 ඉංග්‍රීසි සාහිත්‍ය රසාස්වාදය/இலக்கிய நயம் ஆங்கிலம்/ Appreciation of English Literary Texts
47 සිංහල සාහිත්‍ය රසාස්වාදය/இலக்கிய நயம் சிங்களம்/ Appreciation of Sinhala Literary Texts
48 දෙමළ සාහිත්‍ය රසාස්වාදය/இலக்கிய நயம் தமிழ்/ Appreciation of Tamil Literary Texts
49 අරාබි සාහිත්‍ය රසාස්වාදය/இலக்கிய நயம் அரபு/Appreciation of Arabic Literary Texts
50 නාට්‍ය හා රංග කලාව (සිංහල)/நாடகமும் அரங்கியலும் (சிங்களம்)/ Drama and Theatre (Sinhala)
51 නාට්‍ය හා රංග කලාව (දෙමළ)/நாடகமும் அரங்கியலும் (தமிழ்)/ Drama and Theatre (Tamil)
52 නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)/ நாடகமும் அரங்கியலும் (ஆங்கிலம்)/ Drama and Theatre (English)

➢ තෙවන විෂය කාණ්ඩය/மூன்றாம் பாடத்தொகுதி / Category III

80 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/தகவல் தொடர்பாடலும் தொழினுட்பவியலும்/ Information & Communication Technology
81 කෘෂි හා ආහාර තාක්ෂණය/ விவசாயமும் உணவுத் தொழினுட்பவியலும்/Agriculture & Food Technology
82 ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය/நீருயிரினவளத் தொழினுட்பவியல்/ Aquatic Bioresources Technology
84 ශිල්ප කලා/நுண்கலை/ Art & Crafts
85 ගෘහ ආර්ථික විද්‍යාව/மனைப்பொருளியல்/ Home Economics
86 සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය/சுகாதாரமும் உடற்கல்வியும் / Health & Physical Education
87 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය/தொடர்பாடலும் ஊடகக் கற்கையும் / Communication & Media Studies
88 නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය/வடிவமைப்பும் நிருமாணத் தொழினுட்பவியலும்/ Design & Construction Technology
89 නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය/வடிவமைப்பும் இயந்திரத் தொழினுட்பவியலும்/ Design & Mechanical Technology
90 නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය/வடிவமைப்பும் மின் இலத்திரனியல் தொழினுட்பவியலும் / Design, Electrical & Electronic Technology
92 විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (සිංහල)/மின் ஆவணப்படுத்தலும் சுருக்கெழுத்தும் (சிங்களம்)/ Electronic Writing & Shorthand (Sinhala)
93 විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (දෙමළ)/மின் ஆவணப்படுத்தலும் சுருக்கெழுத்தும் (தமிழ்)/ Electronic Writing & Shorthand (Tamil)
94 විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (ඉංග්‍රීසි)/மின் ஆவணப்படுத்தலும் சுருக்கெழுத்தும் (ஆங்கிலம்)/ Electronic Writing & Shorthand (English)

H.6.4.Su list. indd